දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/ADM/26/2017
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 26/11/2018
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක : 01-54/2018

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියලුම ආයතන ප්‍රධානීන්/ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්/ කාර්යභාර වෛද්‍ය නිලධාරීන්,

වෛද්‍ය නිලධාරීන් (මාතෘ හා ළමා සෞඛ්‍ය)/ වෛද්‍ය නිලධාරීන් (බෝ නොවන රෝග),

සියලුම ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්,

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත.

**<u>පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයන් කලින් හඳුනාගැනීම සඳහා පරීක්ෂා කිරීමේ වැඩසටහන: පූර්ව මුඛ පිළිකාමය තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයින් හඳුනාගැනීම සහ යොමු කිරීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය ලබා ගැනීම.</u>**

මුඛ පිළිකාව ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ තොල්, මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාව ආශ්‍රිතව ඇති වන මෞඛ අපිච්ඡද සෛල පිළිකාවයි. වර්ෂ 2011දී ශ්‍රී ලංකාවේ වාර්තා වූ නව පිළිකා රෝගීන්ගේ දත්ත වාර්තාවලට අනුව මුළු පිළිකා රෝගීන් අතුරින් 16.4 %ක් තොල්, මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාව ආශ්‍රිත පිළිකාවන් වන අතර එය පිරිමින් අතර සුලබම පිළිකාවයි. වර්ෂ 2011 දී පිරිමින් අතර අලුතින් වාර්තාවූ පිළිකා අතරින් 24% ක් තොල් , මුඛ කුහරය සහ මුඛ ග්‍රසනිකාව ආශ්‍රිත පිළිකාවන්ය.

මුඛ පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා කෙතරම් නවීන ප්‍රතිකාර ක්‍රම රාශියක් පැවතුනද, මුඛ පිළිකා රෝගීන්ගේ ප්‍රතිකාරවලින් පසුව වසර පහක් දක්වා ජීවත්වන්නේ ඉන් 50% පමණි. සියලුම පිළිකා වර්ග අතරින් ඉහළතම මරණ අනුපාතයක් (දිනකට මරණ 3ක්) වාර්තා වනුයේ මුඛ පිළිකා සඳහාය. මේ සඳහා ප්‍රධානම හේතුව වනුයේ මුඛ පිළිකා රෝගීන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වන්නේ රෝගයේ අවසාන අවධි වල වීමයි.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් වර්ෂ 2011 සඳහා වූ ප්‍රකාශිත දත්ත අනුව ඉහත කරුණ හොඳින් තහවුරු වේ. එම වාර්තාව අනුව මුඛ පිළිකා රෝගීන්ගෙන් 76% පමණ ප්‍රතිකාර සඳහා යොමුවී ඇත්තේ පිළිකා රෝගී තත්වයෙහි අවසාන අවධිවලය( III සහ IV අවධිවල).

මුඛ පිළිකා ඇතිකිරීමට හේතු වන සාධක සම්බන්ධයෙන් ප්‍රමාණවත් විද්‍යාත්මක පර්යේෂණ සාක්ෂි පවතී. මේ අනුව දුම්කොළ සහිතව හෝ රහිතව බුලත්විට සැපීම, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය දුම්පානය සහ මත්පැන් භාවිතය වැනි පුරුදු මුඛ පිළිකා සඳහා ප්‍රධාන අවදානම් සාධක ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ඉහත පුරුදු බහුලව පවතින බව පෙන්වා දී ඇත.

වර්ෂ 2002/2003 දී සිදුකරන ලද ජාතික මුඛ සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, වයස අවුරුදු 34-44 අතර පුද්ගලයින්ගෙන් 34%ක් ද වයස අවුරුදු 65-74 අතර පුද්ගලයින්ගෙන් 47.7%ක් ද බුලත්විට සැපීම සිදුකළ බව තහවුරු වී ඇත. ශ්‍රී ලාංකීය නාගරික ප්‍රජාව සමඟ සසඳන කළ ග්‍රාමීය ප්‍රජාව තුළ බුලත්විට සැපීම බහුලව දක්නට හැකි වී ඇත. වර්ෂ 2015 දී ශ්‍රී ලංකාවේ සිදුකල බෝ නොවන රෝග වලට අදාළ අවදානම් සාධක පිළිබඳ සමීක්ෂණයට (STEPS survey) අනුව වයස අවුරුදු 18-69 අතර වැඩිහිටි පුරුෂයින්ගෙන් ¼ කට වඩා (26.0%) සහ ආසන්න වශයෙන් කාන්තාවන්ගෙන් 5%ක් පමණ දුම් රහිත දුම්කොළ (Smokless Tobacco) භාවිත කළ බව වාර්තා වී ඇත.මෙම වාර්තාවට අනුව වැඩිහිටි පරපුර දුම් රහිත දුම්කොළ වැඩි වශයෙන් භාවිත කළ බව තහවුරු වී ඇත. එනමුත් මෑතකදී සිදු කරන ලද සමීක්ෂණවලට අනුව වාණිජමය හෝ තමා විසින් සාදා ගත් දුම රහිත දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන තරුණ ප්‍රජාව අතර භාවිතය වැඩි වීමේ ප්‍රවණතාවක් ඇති බව හඳුනා ගෙන ඇත.

මුඛ පිළිකා ඇතිවීම සඳහා වැඩි අවදානමක් ඇති පුද්ගලයින්ගේ මුඛය පරීක්ෂා කිරීම තුළින් පූර්ව මුඛ පිළිකා තත්ත්ව (OPMD) මෙන් ම මුඛ පිළිකාවේ මුල් අවස්ථාව කලින් හඳුනා ගැනීම පහසු කරවයි. මුඛ පිළිකා කලින් හඳුනා ගැනීම මඟින් ප්‍රතිකාරවල සාර්ථකභාවය ඉහළ නැංවීම මෙන්ම රෝගීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමද සිදුවේ.

රියැදුරන්, වතු කම්කරුවන්, ගොවියන්, ධීවරයින්, වැඩබිම් සහ අනෙකුත් කම්කරුවන් සහ ග්‍රාමීය ජනතාව වැනි ජන කොට්ඨාශයන් අතර අවදානම් සාධක බහුලව පවතින බැවින් ඔවුන්ට පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් (OPMD) සහ මුඛ පිළිකා වැළඳීමේ වැඩි අවදානමක් ඇත. එබැවින් පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් සහ මුඛ පිළිකා සම්බන්ධව සිදු කෙරෙන පරීක්ෂා කිරීම් වලදී මෙම ජන කොට්ඨාශයන් වලට වැඩි අවධානයක් යොමුකිරීම වැදගත්වේ.

මුඛ පිළිකා වැළඳීමේ වැඩි අවදානමක් ඇති පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා නිර්ණායක ත්‍රිත්වයක් ගොඩනගා ඇති අතර මෙම පුද්ගලයින් සායනික මුඛ පරීක්ෂාව සඳහා දන්ත ශල්‍ය වෛද්‍යවරු වෙත යොමු කළ යුතුය .

නිර්ණායක ත්‍රිත්වය

1. දිනකට තෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් බුලත් විට සපන පුද්ගලයින්

2. දිනකට තෙවරකට අඩු වාර ගණනක් බුලත් විට සපන සහ ඊට අමතරව දුම්පානය සහ/ හෝ මත්පැන් පානය කරන පුද්ගලයින්
3. පුරුද්දක් වශයෙන් බාබුල් බීඩා, පැන් පරාග්, මාවා වැනි දුම්කොළ සහ/ හෝ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන පුද්ගලයින්

ප්‍රාථමික සෞඛ්‍ය නිලධාරීන්ට, පූර්ව මුඛ පිළිකා සහ පිළිකාවන් වැළදීම සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයන් හඳුනාගැනීම සඳහා වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇති බැවින්, මේ සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් (PHM) සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ (PHI) සේවය ලබා ගැනීමට තීරණය වී ඇත. 2015 ජූලි මස 07 වන දින පැවති පවුල් සෞඛ්‍යය පිළිබඳ ජාතික උපදේශන කමිටු වේ 19 වන රැස්වීම් වාරයේදී මෙම කාර්යය සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ (PHMs) සේවය ලබා ගැනීම අනුමත කරන ලදී. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් (PHM) සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHI) විසින් ඔවුන්ගේ දෛනික ගෘහස්ථ සහ ක්ෂේත්‍ර පිවිසුම් අතරතුර දී මෙම කාර්යය ඉටු කළ හැකි බැවින් එමගින් ඔවුන්ගේ දෛනික සේවාවලට බාධාවක් සිදු නොවනු ඇත.

මුඛ පිළිකා නිවාරණ කටයුතු වැඩි දියුණු කිරීමට හේතු වන පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත පුද්ගලයින් හඳුනාගැනීම සහ මුඛ පිළිකා කලින් හඳුනාගැනීම සඳහා සෞඛ්‍ය ආයතන සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් (ඇමුණුම I ) වෙන්වෙන්ව හඳුනාගෙන ඇත.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ නිත්‍ය ගෘහස්ථ සහ ක්ෂේත්‍ර පිවිසුම් හෝ ප්‍රජාව හමුවන අනෙකුත් අවස්ථා අතරතුර දී ඉහත සඳහන් නිර්ණායක ත්‍රිත්වයට අනුව පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් ඇති පුද්ගලයින් හඳුනා ගැනීම සිදු කළ යුතු ය. ඔවුන් වෙත සපයා ඇති යොමු කිරීමේ පත්‍රිකාව (ඇමුණුම II ) භාවිත කරමින් මෙම පුද්ගලයින් ආසන්නතම රජයේ රෝහලෙහි දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත යොමු කළ යුතු ය. මෙම රෝගීන් රජයේ රෝහල වෙත යොමු කිරීම සඳහා සුදුසුම වේලාව සතියේ දිනවල පෙරවරු 10.30 සිට පෙරවරු 11.30 දක්වා ලෙස හඳුනා ගෙන ඇත. දන්ත සායනයේ දෛනික ප්‍රතිකාර කටයුතු සඳහා සිදුවන බාධාව අවම කිරීම සහ යොමු කරන ලද පුද්ගලයින් සායනයේ රැඳී සිටින කාලය අවම කිරීම සඳහා මෙම කාල පරිච්ඡේදය හඳුනාගෙන ඇත.

දන්ත ශල්‍ය වෛද්‍යවරුන් මෙම පුද්ගලයින් "පූර්ව මුඛ පිළිකා තත්ත්ව කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශය" (Guideline for Management of OPMDs) අනුව පරීක්ෂාකොට රෝගී තත්ත්වය පාලනය කළ යුතුය. අවශ්‍ය අවස්ථාවලදී මෙම පුද්ගලයින් යොමු කිරීමේ පත්‍රිකාව ( ඇමුණුම III) භාවිතයෙන් විශේෂඥ මුඛ හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය (OMF Unit) වෙත යොමු කළයුතුය. දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත යොමුවූ සියලුම යොමු කිරීම් එම පුද්ගලයින් යොමු කළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට එලෙස යොමු කළ පත්‍රිකාවේ පසු පිට ඇති ප්‍රතිපෝෂක පත්‍රය භාවිතා කරමින් නැවත යොමු කළ යුතුය (ඇමුණුම II). මෙම යොමු කිරීම පහසු කිරීම සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන (NCCP) මගින් දැනටමත් සරල ආකෘති පත්‍ර වර්ග දෙකක් (ඇමුණුම II සහ III ) කුඩා පොත් වශයෙන් නිකුත්කොට ඇත.

1. ප්‍රාථමික සෞඛ්‍ය සේවා නිලධාරීන් විසින් වැඩි අවදානම් සහිත පුද්ගලයින් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් වෙත යොමු කිරීමේ පත්‍රිකාව සහ ප්‍රතිපෝෂක පත්‍රය (ඇමුණුම II).

2. දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් රෝගීන් ව විශේෂඥ මුඛ හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය (OMF Unit) වෙත යොමු කිරීමේ පත්‍රිකාව සහ ප්‍රතිපෝෂක පත්‍රය (ඇමුණුම III ).

මෙම යොමුකිරීමේ පත්‍රිකාවේ අනෙක් පස ඇති ප්‍රතිපෝෂක පත්‍රය භාවිතයෙන් දන්ත ශල්‍ය වෛද්‍යවරු විසින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHM/ PHI) වෙත (ඇමුණුම II) ප්‍රතිපෝෂක තොරතුරු ලබා දිය යුතු ය. එමෙන්ම ඇමුණුම III ඇති ප්‍රතිපෝෂක පත්‍රය භාවිතයෙන් මුඛ හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකයේ සේවය කරන දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් රෝගීන් යොමු කරන ලද දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත ප්‍රතිපෝෂක තොරතුරු ලබා දිය යුතු ය.

ශ්‍රී ලංකාවේ පවතින මුඛ පිළිකා ව්‍යසනය මැඩලීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහනට පහසුකම් සැලසීමට සහ සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියලු ම පළාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන් වෙත උපදෙස් දෙනු ලැබේ.

වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් කරුණාකර අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන හෝ එහි විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරයා අමතන්න. (දුරකථන අංක: 011 2368627)

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**වෛද්‍ය අනිල් ජාසිංහ**
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා I & II )
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග කාර්යාංශය )
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දන්ත සේවා)
අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන
අධ්‍යක්ෂ, මාතෘ හා ළමා සෞඛ්‍ය
අධ්‍යක්ෂ, බෝ නොවන රෝග
අධ්‍යක්ෂ, දන්ත සේවා
අධ්‍යක්ෂ, ප්‍රාථමික සෞඛ්‍ය සේවා

ඇමුණුම්

| ඇමුණුම් අංකය | ආකෘති පත්‍රයේ /වාර්තාවේ නම | සකස් කළේ කවුද යන වග | යොමු කළේ කාටද යන වග | තොරතුරු මූලාශ්‍රය | කාල සීමාව |
|---|---|---|---|---|---|
| ඇමුණුම I | සෞඛ්‍ය සේවා ආයතන සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් | - | - | - | - |
| ඇමුණුම II | පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් ඇති පුද්ගලයන් දන්ත ශල්‍ය වෛද්‍යවරු වෙත යොමු කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවකයින් විසින් භාවිත කරනු ලබන යොමු කිරීමේ පත්‍රිකාව සහ ප්‍රතිපෝෂක පත්‍රය | **යොමු කිරීම** පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | - | වැඩි අවදානම් සහිත පුද්ගලයින් හඳුනා ගත පසුව |
| | | **ආපසු යොමු කිරීම** දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් | - | - |
| ඇමුණුම III | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් රෝගීන් ව මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය (OMF unit) වෙත යොමු කිරීමේ පත්‍රිකාව සහ ප්‍රතිපෝෂක පත්‍රය. | **යොමු කිරීම** දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | මුඛ හණුක හා වක්ත්‍ර ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයා / එම ඒකකයේ සේවය කරන දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | - | - |
| | | **ආපසු යොමු කිරීම** මුඛ හණුක හා වක්ත්‍ර ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයා / එම ඒකකයේ සේවය කරන | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | | | |
| ඇමුණුම IV | මුඛ පිළිකා හා පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලේඛනය | දන්ත ශල්‍ය වෛද්‍යවරයා | | - | - |
| ඇමුණුම V | අලුතෙන් වාර්තා වූ මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත පුද්ගලයින් පිළිබඳ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ මාසික වාර්තාව | දන්ත ශල්‍ය වෛද්‍යවරයා | ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා | මුඛ පිළිකා හා පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලේඛනය | ඊට පසු මාසයේ 5 වන දිනය හෝ එම දිනට පෙර |
| ඇමුණුම VI | අලුතෙන් වාර්තා වූ මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත පුද්ගලයින් පිළිබඳ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්තු වාර්තාව | ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරයා | අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන | අලුතෙන් වාර්තා වූ මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත පුද්ගලයින් පිළිබඳ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ මාසික වාර්තාව | ඊට පසු කාර්තුවේ මුල් මාසයේ 25 වන දිනය හෝ එම දිනට පෙර |

ඇමුණුම I

## සෞඛ්‍ය සේවා ආයතනයන් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

### ජාතික පිළිකා මර්දන වැඩසටහනෙහි කාර්යභාරය

- ජන සන්නිවේදන මාධ්‍ය හා අනෙකුත් සන්නිවේදන ක්‍රමයන් භාවිතා කර පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සම්බන්ධව සහ ඊට බලපාන අවදානම් සාධක පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම තහවුරු කිරීම.
- ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය පුහුණු කිරීම: සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ අංශයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම (TOT) සහ ක්ෂේත්‍ර නිලධාරී මට්ටමේ කාර්යමණ්ඩලය දක්වා ක්‍රමිකව පුහුණු කිරීම් සිදු වන බවට තහවුරු කිරීම.
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දන්ත සේවා), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග කාර්යාංශය), අධ්‍යක්ෂ පවුල් සෞඛ්‍ය කාර්යාංශය, අධ්‍යක්ෂ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, අධ්‍යක්ෂ ප්‍රාථමික සෞඛ්‍ය සේවා, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ අනෙකුත් අදාළ අංශ සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ කාර්ය මණ්ඩලය හා මුඛ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීයවේදීන් සමඟ මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීම පිළිබඳ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ශ්‍රී ලංකාව තුළ මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීමේ සමස්ථ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම; සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- රෝගී පරීක්ෂාවන් සඳහා යොමු කරන ලද පුද්ගලයන් සහ රෝග විනිශ්චය කරන ලද රෝගීන් පිළිබඳව දත්ත ලැබීම, දත්ත නිසි ලෙස සම්පාදනය කිරීම හා දත්ත විශ්ලේෂණය කිරීම තහවුරු කිරීම.
- සෞඛ්‍ය ආයතන සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ වලට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම් සඳහා වන සැපයුම් දාම කළමණාකරණය කිරීම .

### පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාගේ කාර්යභාරය (PDHS)

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, පළාත් ප්‍රජා දන්ත ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් හා ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය අමාත්‍යංශයේ දිස්ත්‍රික් මට්ටමේ කාර්ය මණ්ඩලය, මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීම පිළිබඳ වැඩසටහන හා සම්බන්ධීකරණය කිරීම.
- පළාත් මට්ටමෙන් වැඩසටහන අධීක්ෂණය කිරීම සහ ඇගයීම.

### ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගේ (RDHS) කාර්යභාරය

- ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා සහ දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික් මට්ටමේ සෞඛ්‍ය කාර්යමණ්ඩලය සමඟ මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීම පිළිබඳ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- දිස්ත්‍රික් මට්ටමෙන් මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීම පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම.
- දන්ත සායනයන වලට මුඛ පරීක්ෂාව සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම .

**පළාත් ප්‍රජා දන්ත ශල්‍ය විශේෂඥ වෛද්‍යතුවරයාගේ (CCD) කාර්යභාරය**

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග) හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශයේ දිස්ත්‍රික් මට්ටමේ කාර්යමණ්ඩලය සමඟ මුඛ පිළිකා නිවාරණය කිරීමේ හා කලින් හඳුනාගැනීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- ජාතික පිළිකා මර්දන වැඩසටහන සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දිස්ත්‍රික් මට්ටමේ කාර්යමණ්ඩලය සමඟ, තම පළාත තුළ ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය සඳහා මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනාගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් දක්වා ක්‍රමිකව පුහුණු කිරීම් සිදුවන බවට තහවුරු කිරීම.
- පළාත තුළ පූර්ව මුඛ පිළිකා තත්ත්ව/මුඛ පිළිකා සහ ඒවායේ අවදානම් සාධක පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම තහවුරු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලය සමඟ පූර්ව මුඛ පිළිකා තත්වයන් සහ මුඛ පිළිකා පිළිබඳව වැඩි අවදානම් තත්වයේ පසුවන පුද්ගලයන් ඉලක්ක ගත කරගනිමින් ඔවුන්ගේ දැනුම්වත් භාවය ඇති කිරීම සහ එම පුද්ගලයන්ගේ පූර්ව මුඛ පිළිකා තත්වයන් හෝ මුඛ පිළිකා සම්බන්ධව පරීක්ෂා කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- යොමුකරන ලද රෝගීන් පිළිබඳ දත්ත සහ හඳුනාගත් රෝගීන් පිළිබඳ දත්ත සම්පාදනය සහ විශ්ලේෂණය පළාත් මට්ටමින් සිදුකිරීම සහ මේ පිළිබඳ ජාතික පිළිකා මර්දන වැඩසටහන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම.
- පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා තත්ත්ව සඳහා බලපාන අවදානම් සාධක පිළිබඳ පළාත් මට්ටමින් සමීක්ෂණ පැවැත්වීම.
- පළාත් මට්ටමෙන් මෙම වැඩසටහන අධීක්ෂණය කිරීම හා ඇගයීම.

**ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයාගේ (RDS) කාර්යභාරය**

- දිස්ත්‍රික් මට්ටමෙන් මුඛ පිළිකා නිවාරණය කිරීමේ හා කලින් හඳුනාගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුලු දිස්ත්‍රික් මට්ටමේ සෞඛ්‍ය කාර්යමණ්ඩලය සමඟ මුඛ පිළිකා වැළැක්වීමේ සහ කලින් හඳුනා ගැනීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය විසින් යොමු කරන ලද වැඩි අවදානම් සහිත පුද්ගලයන් පරීක්ෂා කිරීම සඳහා ප්‍රදේශයේ සිටින දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සම්බන්ධීකරණය කිරීම.
- මුඛ පිළිකා වැළැක්වීමේ සහ කලින් හඳුනා ගැනීමේ වැඩසටහන, බෝ නොවන රෝග පරීක්ෂා කිරීමේ පොදු වැඩසටහන් වලට ඇතුළත් කිරීම සඳහා දිස්ත්‍රික්කයේ වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග) සමඟ සම්බන්ධීකරණය කිරීම.
- දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්, ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් හා ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- තම දිස්ත්‍රික්කය තුළ පත්‍රිකා, ලේඛන හා වාර්තා සැපයීම සහ බෙදා හැරීම ප්‍රමාණවතව සිදුවන බව තහවුරු කිරීම.

- දිස්ත්‍රික්කයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කිරීම මඟින් දිස්ත්‍රික්ක මට්ටමෙන් වැඩි අවදානම් තත්ත්වයේ පසුවන පුද්ගලයන් පරීක්ෂා කිරීම සඳහා සහ ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා සහ ප්‍රදේශයේ දන්ත වෛද්‍ය වරුන් සමග සම්බන්දීකරණය කිරීම තුළින් ප්‍රාථමික සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් යොමුකරන ලද වැඩි අවදානම් සහිත පුදගලයන් දන්ත වෛද්‍ය වරයා විසින් පරීක්ෂා කරන බවට තහවරු කිරීම.
- රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් එවනු ලබන මාසික වාර්තාවන් පාදක කර ගනිමින් පූර්ව මුඛ පිළිකා සහ මුඛ පිළිකා සහිත නව රෝගීන්ගේ කාර්තු වාර්තාව (ඇමුණුම VI) සකස් කර අධ්‍යක්ෂක, පිළිකා මර්දන වැඩසටහන වෙත ඊට පසු කාර්තුවේ පළමුවන මාසයේ 25 වැනි දින හෝ ඊට පෙර එවිය යුතුය

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ (MOH) කාර්යභාරය**

- මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීමේ වැඩසටහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශ මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම.
- මුඛ පිළිකා නිවාරණය සහ කලින් හඳුනා ගැනීමේ වැඩසටහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යමණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා සහ ප්‍රදේශයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම තුළින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලය මඟින් යොමු කරන ලද වැඩි අවදානම් සහිත පුද්ගලයන් දන්ත ශල්‍ය වෛද්‍යවරයා විසින් පරීක්ෂා කරන බවට තහවරු කිරීම.
- දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්, ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් හා ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.

**මහජන සෞඛ්‍ය හෙද සොයුරිය (PHNS) / පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්(SPHI ) / පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ කාර්යභාරය (SPHM)**

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය සමඟ එක්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මට්ටමෙන් මුඛ පිළිකා නිවාරණ සහ කලින් හඳුනා ගැනීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරිම.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශයට අනුයුක්ත ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය වෙත අවශ්‍ය ප්‍රමාණයට යොමු කිරීමේ පත්‍රිකා ලැබීම අධීක්ෂණය කිරීම.
- ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා සමඟ සම්බන්ධීකරණය කිරීම මඟින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මට්ටමෙන් වැඩි අවදානම් තත්ත්වයේ පසුවන පුද්ගලයන් පරීක්ෂා කිරීමේ වැඩසටහන් සහ ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

**පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි (PHM) හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ කාර්යභාරය (PHI)**

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී ප්‍රදේශ මට්ටමෙන් මුඛ පිළිකා නිවාරණය කලින් හඳුනා ගැනීමේ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම.
- පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයන් හඳුනාගෙන ගෙන යොමු කිරීමේ පත්‍රිකාව (ඇමුණුම II) භාවිතයෙන් (ගෘහස්ථ සහ ක්ෂේත්‍ර පිවිසුම් වලදී) ඔවුන්ව ආසන්නතම රජයේ දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත යොමු කිරීම.
- යොමු කිරීමේ පත්‍රිකාවේ පිටපතක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී / මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී විසින් තබා ගත යුතුය.
- සෞඛ්‍යයට අයහපත් පුරුදු වළක්වා ගැනීම සහ ස්වයං මුඛ පරීක්ෂාවෙහි වැදගත්කම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
- මුඛ පිළිකා වැළදී ඇති බවට තහවුරු කළ රෝගීන් රෝහල් වෙත වාර්තා නොවූ විට ක්ෂේත්‍රයෙදි ඔවුන් පිළිබඳ පසු විපරම් කිරීම.

**රජයේ රෝහල්වල දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ (Dental Surgeon) කාර්යභාරය.**

- දන්ත සායනයට සහභාගී වන සියලු ම රෝගීන්ගේ අදාල ප්‍රතිකාරයට අමතරව පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් (OPMD) සහ මුඛ පිළිකා වැළදී තිබේද යන්න පරීක්ෂා කිරීම.
- ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය විසින් හෝ ස්වේච්ඡාවෙන් පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් සහ මුඛ පිළිකා පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා යොමු වූ පුද්ගලයින් ප්‍රමුඛත්වයක් දී පරීක්ෂා කළ යුතුය. (පරීක්ෂා කිරීම සඳහා සතියේ දිනවල පෙ. ව. 10.30 සිට පෙ. ව. 11.30 දක්වා රෝගීන් යොමු කරන ලෙස ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලයට උපදෙස්දී ඇත).
- ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය විසින් හෝ ස්වේච්ඡාවෙන් හෝ පූර්ව මුඛ පිළිකා තත්ත්වයන් සහ මුඛ පිළිකා සඳහා යොමු වූ පුද්ගලයින්ට මුඛ සෞඛ්‍ය තත්වය වැඩි දියුණු කිරීම සහ අයහපත් පුරුදු වළක්වා ගැනීම සඳහා උපදෙස් ලබා දීම.
- “පූර්ව මුඛ පිළිකා තත්ත්ව පාලනය කිරීම සඳහා වන මාර්ගෝපදේශය”ට අනුව පූර්ව මුඛ පිළිකා තත්ත්ව (OPMD) සහිත පුද්ගලයන්ගේ රෝග කළමනාකරණය කිරීම සිදු කළයුතුය. මෙම රෝග කළමනාකරණය දන්ත වෛද්‍ය සයනය තුළදීම හෝ වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් එම ප්‍රතිකාර සඳහා ලබා දී ඇති යොමු කිරීමේ පත්‍රිකාව (ඇමුණුම III) භාවිත කරමින් මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය වෙත යොමු කිරීම සිදු කළ යුතුය (යොමු කිරීමේ පත්‍රිකාවේ අනු පිටපතක් දන්ත සායනයේ තබා ගන්න).
- මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය විසින් සිදු කරනු ලබන නැවත යොමු කිරීමක දී මුඛ සෞඛ්‍ය තත්වය වැඩිදියුණු කිරීම සහ පසු විපරම ප්‍රතිකාර අදාළ ප්‍රතිකාර සැලැස්මට අනුව සිදු කළ යුතු ය.
- පූර්ව මුඛ පිළිකා තත්ත්වය පිළිකාවක් බවට පත් වීම වැළැක්වීමේ දී පූර්ව මුඛ පිළිකා (OPMD) සහිත රෝගීන්ගේ මුඛ සෞඛ්‍යය තත්ත්වය වැඩි දියුණු කිරීම ඉතා වැදගත් පියවරක් ලෙස සැලකේ. එබැවින්, පූර්ව මුඛ පිළිකා තත්ත්ව(OPMD) සහිත රෝගීන්ගේ, එම රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර ආරම්භ කිරීමට පෙර හෝ වැඩිදුර වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකක වෙත යොමු

කිරීමට පෙර, ප්‍රාථමික සත්කාර ආයතනයන්හි දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් ඔවුන්ගේ මුඛ සෞඛ්‍ය වැඩි දියුණු කිරීමට ක්‍රියා කළ යුතුය.

- මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන්ගේ ලියාපදිංචි ලේඛනයක් (ඇමුණුම IV) සායනය තුළ පවත්වාගෙන යා යුතුය.
- එම ලියාපදිංචි ලේඛනයේ මාසික සාරාංශයක් (ඇමුණුම V) ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත ඊට පසු මාසයේ 5 වන දින හෝ ඊට පෙර එවීම සඳහා කටයුතු කළ යුතු ය.
- රෝහල් දන්ත සායනයේ මාසික වාර්තාව (H 1201 ආකෘතිය) මඟින් ද පූර්ව මුඛ පිළිකා තත්ත්ව (OPMD) පිළිබඳ අදාල ස්ථාන වලට වාර්තා කළ යුතු ය.
- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක යටතට නොගැනෙන දන්ත සායන භාර දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින්ද මුඛ පිළිකා හා පූර්ව මුඛ පිළිකා තත්ත්ව වලට අදාළ සියලු ලේඛණ පවත්වාගෙන යා යුතුය. ඉහත දැක්වෙන ආකාරයට මේ පිළිබඳ වාර්තා අදාළ ස්ථාන වලට යැවිය යුතුය.

**වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය ( විශේෂයෙන්ම සුවදිවි මධ්‍යස්ථානය- HLC / බාහිර රෝගී අංශය -OPD, වෛද්‍ය නිලධාරීන් සඳහා)**

- මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් පවතින බවට හඳුනා ගැනීම සඳහා වන නිර්ණායක ත්‍රිත්වයට අනුව එම පුද්ගලයන් හඳුනා ගැනීම හා ඔවුන් විධිමත් සායනික මුඛ පරීක්ෂණයක් සඳහා, ආසන්නතම රජයේ දන්ත සායනය වෙත යොමු කිරීම.
- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශිත "පූර්ව මුඛ පිළිකා තත්ත්ව පාලනය කිරීම සඳහා මාර්ගෝපදේශය" පරිශීලනය කිරීම මඟින් පූර්ව මුඛ පිළිකා තත්වයන් පිළිබඳව තාක්ෂණික උපදෙස් ලබාගැනීම.
- පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයන්හට එම අවදානම් පුරුදු වලින් ඈත්වීම සඳහා සහාය වීම.

**මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය විශේෂඥ ඒකකයන්හි (OMF units) කාර්යභාරය**

- මුඛ, හනුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකයට ප්‍රතිකාර උදෙසා පැමිණි පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සහිත රෝගීන් සායනිකව කළමනාකරණය කිරීම.
- පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සහිත රෝගීන්ගේ මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා, අදාළ දන්ත සායනය වෙත රෝගීන් නැවත යොමු කිරීම හා ඒ පිළිබඳව පසු විපරම් කිරීම (දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් රෝගියාව යොමු කර ඇත්නම් රෝගියා විසින් රැගෙන ආ යොමු කිරීමේ පත්‍රයේ පසුපිට භාවිතා කොට නැවත යොමු කිරීම සිදු කළ යුතුය).
- ප්‍රජා දන්ත සෞඛ්‍ය / මුඛ සෞඛ්‍ය නිවාරණ ඒකක හා එක්ව පූර්ව මුඛ පිළිකා සහිත රෝගීන්ගේ අයහපත් සෞඛ්‍ය පුරුදු වැළැක්වීම සඳහා උපදේශන ලබාදීම සහ මුඛ සෞඛ්‍ය තත්වය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම (එම ඒකක ප්‍රදේශයේ ඇත්නම් ).
- අලුතෙන් වාර්තා වූ මුඛ පිළිකා රෝගීන්ගේ දත්ත පිළිබඳ ලියාපදිංචි ලේඛනය මුඛ, හනුක හා වක්ත්‍ර ශල්‍ය සායනයෙහි පවත්වාගෙන යාම. වර්ෂික වාර්තා පොදු චක්‍රලේඛ අංක 01-33/2012 ට අනුව

අධ්‍යක්ෂක , පිළිකා මර්දන වැඩසටහන, මහජන සෞඛ්‍ය සංකීර්ණය, 555/5, ඇල්විටිගල මාවත, කොළඹ 5 වෙත යැවීම.

**පෞද්ගලික අංශයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ වෛද්‍යවරුන්ගේ කාර්යභාරය**

- දන්ත වෛද්‍ය / වෛද්‍ය සායනය සඳහා පැමිණෙන සියලුම රෝගීන් පූර්ව මුඛ පිළිකා තත්ව සහ මුඛ පිළිකාවන් සඳහා පරීක්ෂා කිරීම
- පූර්ව මුඛ පිළිකා තත්ව හෝ මුඛ පිළිකා සහිත රෝගීන් වැඩිදුර ප්‍රතිකාර සඳහා ළඟම ඇති මුඛ, හනුක හා වක්ත්‍ර ශල්‍ය ඒකක වෙත යොමු කිරීම
- බුලත්විට, දුම්කොළ හෝ පුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් වලින් වැළකීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

ඇමුණුම II

## පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහ මුඛ පිළිකා සඳහා වැඩි අවදානමක් සහිත පුද්ගලයන් දන්ත ශල්‍ය වෛද්‍යවරු වෙත යොමු කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය විසින් භාවිත කරනු ලබන යොමු කිරීමේ පත්‍රිකාව

| | | | |
|---|---|---|---|
| මුඛ සෞඛ්‍ය පරීක්ෂණය සඳහා යොමු කිරීමේ පත්‍රිකාව<br>வாய் சுகாதாரப் பரிசோதனை சம்பந்தமான விண்ணப்பப்படிவம் | | | දිනය / திகதி |
| සෞ. වෛ. නි. කොට්ඨාශය /சு.வை.அ.பிரிவு | ම.සෞ.ප. කොට්ඨාශය /பொ.சு.ப.பிரிவு<br>ප. සෞ. සේ. නි. කොට්ඨාශය/கு.சு.சே.நி.பிரிவு | | |
| නම / பெயர்: | | ස්ත්‍රී/பெண் ☐ | පුරුෂ/ஆண் ☐ |
| වයස/வயது: | ලිපිනය/<br>முகவரி: | | දුර. අංකය/தொ. பே. இல. |
| යොමු කිරීමට හේතුව / பரிசோதனைக்காண காரணம் | | | |
| බුලත්විට සැපීම/வெற்றிலை போடுதல் ......... ☐ | | මද්‍යසාර භාවිතය/மது அருந்துதல் .................. ☐ | |
| දුම්පානය/புகைத்தல் ......................................... ☐ | | වෙනත් /வேறு ......................................................... ☐ | |
| යොමුකළ නිලධාරියාගේ අත්සන<br>பரிந்துரை செய்யப்பட்ட வைத்தியரின் கையொப்பம் | | යොමු වියයුතු රෝහල<br>செல்ல வேண்டிய வைத்தியசாலை | |

## දන්ත ශල්‍ය වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු ප්‍රතිපෝෂක පත්‍රිකාව

**දන්ත වෛද්‍යවරයා සඳහා පමණි / பல் வைத்தியரின் உபயோகத்திற்கு மாத்திரம் (Back referral form)**

සායනික විනිශ්චය/பிணியாய்வு அவதானிப்பு: ..............................................................................................

..............................................................................................................................................................

වෛද්‍යවරයාගේ නිර්දේශය/வைத்திய பரிந்துரை: ..........................................................................................

..............................................................................................................................................................

| | | | |
|---|---|---|---|
| නැවත පරීක්ෂා කිරීම:<br>மீள்பரிசோதனை | මාස 3ට පසු<br>3 மாதத்தின்பின் ☐ | මාස 6ට පසු<br>6 மாதத்தின்பின் ☐ | වසරකට පසු<br>ஒருவருடத்தின்பின் ☐ |

වෙනත් කරුණු /ஏனைய குறிப்பு: ...........................................................................................................

| | | |
|---|---|---|
| දන්ත ශල්‍ය වෛද්‍යවරයාගේ අත්සන ..............................<br>பல் வைத்தியரின் கை ஒப்பம் | රෝහල/ සායනය ......................................<br>வைத்தியசாலை/நிலையம் | දිනය ...............................<br>திகதி |

ඇමුණුම III

**දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් රෝගීන්ව මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකය (OMF Unit) වෙත යොමු කිරීමේ පත්‍රිකාව.**

| Referral form to OMF Surgical Unit | | |
|---|---|---|
| Name of the patient: | | Male ☐ Female ☐ |
| Age: | Address: | Telephone number: |
| Habits:<br>Betel Chewing .................................. ☐ Consuming Alcohol .................................. ☐<br>Smoking .................................. ☐ Other .................................. ☐ | | |
| Reason for referral: .................................................................................... | | |
| Dental Surgeon's Signature .......................... | Hospital .................................. | Date ........................ |

**මුඛ, හණුක හා වක්ත්‍ර ශල්‍ය ඒකකයේ දන්ත ශල්‍ය වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු ප්‍රතිපෝෂක පත්‍රිකාව**

**To be filled by the dental surgeon at OMF Surgical Unit (For feedback)**

Diagnosis: ....................................................................................

Treatment plan: ....................................................................................

....................................................................................

To be reviewed in: 3/12 ☐ 6/12 ☐ 1 year ☐

Any comment: ....................................................................................

Dental Surgeon's Signature .......................... Hospital .................................. Date ........................

**ඇමුණුම IV**

**මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන්ගේ ලියාපදිංචි ලේඛනය**

**Name of the Dental Surgeon** ................................................ **Year/Month** ................................................

| Date | Regd No. | Patient's Name | Age/ Sex | NIC No. | Address | Site | Referred by | Clinical Diagnosis | Management | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | Treatment | Referred to |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ඇමුණුම V

## මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සඳහා වන දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ මාසික වාර්තාව

මෙම මාසික වාර්තාව දන්ත ශල්‍ය වෛද්‍යවරයා / කාර්ය භාර දන්ත ශල්‍ය වෛද්‍යවරයා සැකසිය යුතු අතර අදාළ වාර්තාව ඊට පසු මාසයේ 5 වන දිනට හෝ ඊට පෙර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත යැවිය යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| Year | | Month | | RDHS Division | |
| Name of the Institution | | | | | |

| | | | | |
|---|---|---|---|---|
| Number of high-risk individuals referred by (based on the PHC referral booklet) | PHC staff | MO | Self referral | Other |
| | | | | |
| Number of high-risk individuals reported to the Dental Clinic | | | | |

**Information on indivials with OPMD/ suspected Oral Cancers**

| (Please refer the Register for new patients with Oral Cancer and Oral Potentially Malignant Disorders) | Referred by | | | | Total |
|---|---|---|---|---|---|
| | Self referral | PHC staff | GP | Other | |
| Total number of OPMDs detected at dental clinics | | | | | |
| Total number of suspected Oral Cancers detected at dental clinics | | | | | |

**Details of OPMD and suspected Oral Cancer detected at the Dental Clinic**

| Condition | | Male | Female | Total |
|---|---|---|---|---|
| 1 | Leukoplakia | | | |
| 2 | Erythroplakia | | | |
| 3 | Oral sub mucous fibrosis | | | |
| 4 | Oral lichen planus | | | |
| 5 | Other OPMDs | | | |
| Total number of OPMDs | | | | |
| Total number of suspected Oral Cancer | | | | |

| Special Remarks: |
|---|
| |

Name of Dental Surgeon :..........................................................................

Date :.......................................................

Signature :.........................................................

## මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන් පිළිබඳ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ කාර්තු වාර්තාව

මෙම කාර්තු වාර්තාව පිළියෙළ කල යුත්තේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් සකසක් කරන ලද මුඛ පිළිකා සහ පූර්ව මුඛ පිළිකා තත්ත්ව සහිත නව රෝගීන්ගේ මාසික වාර්තාව පදනම් කරගෙනය. මෙම කාර්තු වාර්තාව ඊළඟ කාර්තුවේ 25 වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂක , ජාතික පිළිකා මර්දන වැඩසටහන, මහජන සෞඛ්‍ය සංකීර්ණය , 555/5 ඇල්විටිගල මාවත, කොළඹ එවිය යුතුය.

Year ☐ Quarter 1 (Jan-March) ☐ Quarter 2 (April-June) ☐ Quarter 3 (July-Sept) ☐ Quarter 4 (Oct-Dec)

| RDHS Division | | Under RDHS Division | Line Ministry |
|---|---|---|---|
| No of dental clinics in the District | | | |
| No of dental clinics who send all 3 retruns at the end of the quarter | | | |

**Information on high-risk individuals**

<table>
<tr><td rowspan="2">Number of high risk individuals referred to the dental clinics by PHC staff during the quarter (Based on the PHC referral booklet)</td><td>PHC staff</td><td>MO</td><td>Self</td><td>Other</td><td rowspan="2">Number of high-risk individuals reported to the Dental Clinic during the quarter</td><td rowspan="2"></td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
</table>

**Details of OPMD and suspected Oral Cancer detected at the Dental Clinic**

| | OPMD Type | Male | Female | Total | | OPMD Type | Male | Female | Total |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Leukoplakia | | | | 5 | Other OPMDs | | | |
| 2 | Erythroplakia | | | | 6 | Total No of OPMD's | | | |
| 3 | Oral sub mucous fibrosis | | | | 7 | Total No of suspected Oral Cancer | | | |
| 4 | Oral lichen planus | | | | | | | | |

| (Please refer the Register for new patients with Oral cancer and Oral Potentially Malignant Disorders) | Referred by | | | | Total |
|---|---|---|---|---|---|
| | Self référral | PHC staff | MO | Other | |
| Total number of OPMDs detected at dental clinics | | | | | |
| Total number of suspected oral cancers detected at dental clinics | | | | | |

| Special Remarks: |
|---|
| |

Name of Dental Surgeon:……………………………………………………………………………

Date :…………………………………………..

Signature :……………………………………………